# ලෝක කම්කරු පන්ති ව්‍යාපාරය ගොඩනැගූ

# ලෙනින්



**ලෝක කම්කරු පන්ති ව්‍යාපාරයේ සදාදරණීය නායකයා වශයෙන් සැලකෙන 1870 අප්‍රේල් 22දා උපන් ව්ලැදිමීර් ඉලීච් උල්යානොව් හෙවත් ව්ලැදිමීර් ඉලීච් ලෙනින්, සිය දිවියෙන් සමුගෙන, හෙටට (21 දාට) වසර 100කි. මේ ලිපිය ඒ නිමිත්තෙනි.**


ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රධාන ලේකම්

**වෛද්‍ය ජී. වීරසිංහ**


ඔහුගේ විප්ලවීය හද ගැස්ම නතර වූයේ 1924 ජනවාරි මස 21 වැනිදය. ලොව පුරා කෝටි සංඛ්‍යාත ජනතාව දහනව වන, විසිවන වන සහ විසිඑක් වන ශතවර්ෂවල දී ඔහු හඳුන්වමින් සිටින්නේ 'ලෙනින්' යන නාමයෙනි.

ලෙනින්ගේ ශ්‍රේෂ්ඨත්වය කුමක්ද? ඔහු රුසියාවේ, වැඩකරන ජනතාවගේ විප්ලවවාදී පක්ෂය බිහි කළේය. රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පක්ෂය, නැත්නම් සෝෂල් ඩිමොක්‍රටික් වර්කස් පාර්ටි ඔෆ් රෂියා නම් වූ එම පක්ෂයට න්‍යායාත්මක මග පෙන්වීම ලබා දෙමින් එවකට පැවති දෘෂ්ටිමය කුණාටු සහ සුළි සුළං මධ්‍යයේ නව පන්නයේ පක්ෂයක් වශයෙන්, ඔහු එය ගොඩනැංවීය.

1898 දී ආරම්භ වූ එම පක්ෂය හරහා 1917 රුසියාවේ සිදුවූ පෙබරවාරි සහ ඔක්තෝබර් විප්ලවයන්ට නායකත්වය ලබා දුන්නේ ද ලෙනින්ය. එම විප්ලව ජයග්‍රාහී විය. ඒ මහා ජයග්‍රහණ හරහා වැඩකරන ජනතාවගේ සංවිධානාත්මක ව්‍යාපාරයකට, පුරෝගාමී බලඇණිය හෙවත් විප්ලවවාදී පක්ෂයේ මගපෙන්වීම ඇත්නම්, ජයග්‍රාහී විප්ලවයකින් බලය ලබාගත හැකි බව ලෙනින් ලොවට පෙන්වා දුන්නේය.

1917 ශ්‍රේෂ්ඨ ඔක්තෝබර් විප්ලවය මගින් එතෙක් ලෝකයේ පැවති ඒකමිතික ආර්ථික රටාව දෙකඩ කළේය. ධනවාදී ලෝක ආර්ථික රටාව කඩා බිඳ දමා, නව ආකාරයක ආර්ථික ක්‍රමයක් බිහි කොට, සමාජවාදී ආර්ථිකයක් ලොවට හඳුන්වා දුන්නේය.

අසල්වැසි හා දුරස් බාහිර බලවතුන් මෙන්ම ඔවුන්ගේ සහාය ලද අභ්‍යන්තර ප්‍රතිවිප්ලවවාදීන් ගෙනගිය විවිධ ප්‍රතිවිප්ලවකාරී කැරලි හා සටන් පරාජය කොට විප්ලවය සහ විප්ලවීය රාජ්‍යය සුරක්ෂිත කිරීමට ඔහු නායකත්වය දුන්නේය.

1922 දෙසැම්බර් 30 වැනි ද, සෝවියට් සමාජවාදී සමූහාණ්ඩු සංගමය බිහිවූයේ ලෙනින්ගේ මග පෙන්වීමෙනි. මෙම මහා සමාජවාදී රාජ්‍යය කෙටි කලක් තුළ ලොව මහා කාර්මික බලවතෙක් බවට පත්වූ අතර ආර්ථික වශයෙන් සංවිධිත, සංවර්ධිත රාජ්‍යයක් බවට පත්විය. දෙවන ලෝක යුද්ධයේ දී පැසිස්ට් ජර්මනිය මෙන්ම ඉතාලි හා ජපාන සගයින් ද පරාජය කිරීමේ තීරණාත්මක කාර්යභාරය සෝවියට් රාජ්‍යය ඉටු කළේය.

නවීන විද්‍යාවේ, කලාවේ, සාහිත්‍යයේ, සංස්කෘතික දියුණුවේ ඉහළටම පැමිණි සෝවියට් රාජ්‍යය අභ්‍යවකාශය ද ජයගත් අතර ආර්ථික, මිලිටරි සහ දේශපාලන වශයෙන් ලොව අනභිභවනීය රාජ්‍යයක් බවට පත් විය.

ලෙනින් ගොඩනැගූ පක්ෂයේ නායකත්වයෙන් විප්ලවය ජය ගැනීම හා එහි මග පෙන්වීමෙන් සෝවියට් සංගමය ආර්ථික, මිලිටරි හා දේශපාලන බලවතකු ලෙස කෙටි කාලයක් තුළ මතුවීම මගින් ලෝකය පුරාම කොමියුනිස්ට් හා කම්කරු පක්ෂ බිහිවන්නටත්, කම්කරු පන්ති ව්‍යාපාරය ශක්තිමත් වී තම අයිතිවාසිකම් වෙනුවෙන් වූ අරගල උත්සන්න කිරීමටත් ලැබුණේ ආශ්වාදජනක මගපෙන්වීමකි.

දෙවන ලෝක මහා යුද්ධයේ දී ලෙනින් බිහි කළ සෝවියට් සංගමය සිදු කළ කැපවීම හා පැසිස්ට්වාදය පරාජය කිරීමට දැක්වූ විශිෂ්ට දයකත්වය නිසා යුරෝපයේ, ආසියාවේ හා ලතින් ඇමෙරිකාවේ උත්සන්න වූ ජාතික විමුක්ති අරගල හරහා නව නිදහස් රාජ්‍යයක් බිහිවූයේ ද සෝවියට් සංගමයේ හා සමාජවාදී රාජ්‍ය පද්ධතියේ සහයෝගීතාව නිසාය.

ලංකාවේ වාමාංශික දේශපාලන ව්‍යාපාරය බිහිවන්නේ ද නිදහස් අරගලය නව ආරකින් උත්සන්න වූයේ ද ඉහත සඳහන් කළ සන්දර්භය තුළම බැව් ඉතා පැහැදිලිය. නිදහස ලැබීමෙන් අනතුරුව ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජීය සංවර්ධනයට සෝවියට් සංගමය දැක්වූ දයකත්වය අනභිභවනීය ය.

රට තුළ කාර්මික පදනම ශක්තිමත් කිරීමටත් කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහාත් සෝවියට් සංගමය දයක වූවා පමණක් නොව සංස්කෘතික හා සාහිත්‍ය ක්ෂේත්‍රයේ සංවර්ධනයටත් සහයෝගීතාවටත් දයක වූයේය. රුසියානු හා සෝවියට් සාහිත්‍ය මෙන්ම, මෙරට භාවිත වන සියලුම මාක්ස්-ලෙනින්වාදී පොතපත සිංහල හා දෙමළ භාෂාවලින් දැරිය හැකි මුදලකට සැපයූවේද සෝවියට් සමාජවාදී ක්‍රමයේ තිබූ මානවවාදී ගුණය නිසාය. ලාංකීය කලාකරුවන් ගෝලීය කරළියට පිවිසියේ සෝවියට් සංගමය හරහාය. ලංකාවේ සංවර්ධනයට දයක වීම සඳහා දහස් සංඛ්‍යාත වෘත්තිකයන් පුහුණු කරනු ලැබුවේ මුළුමනින්ම නොමිලේය.

ජාත්‍යන්තරවාදය එබඳු විය.

1898 රුසියානු සමාජ ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පක්ෂය බිහිකිරීමෙන් ආරම්භව නව පන්නයේ පක්ෂය බිහි කරමින් මාක්ස්වාදී භාවිතය හා න්‍යාය ආරක්ෂා කරමින් භාවිතය හා පර්යේෂණ හරහා මාක්ස්වාදය පෝෂණය කරමින් නව යුගයට ගලපමින්, ලෙනින් කළ මෙහෙය කොතෙක්ද යත් දැන් මාක්ස්වාදය ලොව පුරා හඳුන්වන්නේ මාක්ස්-ලෙනින්වාදය ලෙසය.

මහා සාහිත්‍යවේදී ව්ලැදිමීර් මායාකොව්ස්කි වරක් පෙන්වා දුන් පරිදි, ලෙනින් ජීවත් වූයේය, ලෙනින් ජීවත් වන්නේය... ලෙනින් අනාගතයේ ද ජීවත් වනු ඇත...